**unit 04**

# ආණ්ඩුවේ ස්වභාවය

වාගීෂ්වර

## 4.1 ආණ්ඩුව

- ආණ්ඩුව හඳුනාගැනීම
- ආණ්ඩුව සමාජ සංවිධානයක් ලෙස අනෙකුත් සමාජ සංවිධාන වලින් වෙනස් වන ආකාරය
- ආණ්ඩුවේ බලය
- ආණ්ඩුවේ බලය යෙදීමේ විධි ක්‍රම
- ආණ්ඩුවේ බලය ක්‍රියාවට නැංවීමේ උපකරණය
- ආණ්ඩුවේ බලය සංවරණය කිරීමේ මාර්ග

sureka wageeshwara

# ආණ්ඩුව හඳුනාගැනීම

# ආණ්ඩුව හඳුනාගැනීම

ලක්ෂණයක් ලෙස,

ආණ්ඩුව යනු, රාජ්‍යය නිර්මාණයවීමට අදාළ සංයුතික මූලධර්ම අතරින් එකකි. රාජ්‍යය නිර්මාණයවීමට අදාළව ආණ්ඩුව **කෘත්‍රිම ලක්ෂණයක්** ලෙස ද **ද්විතීක ලක්ෂණයක්** ලෙස ද හඳුනාගත හැකිය.

කෘත්‍රිම ලක්ෂණයක් බව, රාජ්‍යය නිර්මාණයවීමට අදාළ ලක්ෂණ හතරින් භූමිය සහ ජනගහනය ස්වාභාවික ලක්ෂණ වෙයි. **ආණ්ඩුව යනු ජනතාව විසින් නිර්මාණය කර ගන්නා සාධකයකි. එම නිසා එය කෘත්‍රිම ලක්ෂණයක් ලෙස අර්ථකථනය කළ හැකිය.**

ද්විතීක ලක්ෂණයක් බව , රාජ්‍යය නිර්මාණයවීමට අදාළව භූමිය සහ ජනගහනය මූලික, ප්‍රාථමික ලක්ෂණ වේ. ආණ්ඩුව යනු , භූමිය සහ ජනගහනය යන සාධකයන්ට පසුව රාජ්‍යය බිහිවීම සඳහා අවශ්‍ය වන සාධකයකි. එම නිසා එය **ද්විතීක ලක්ෂණයක් ලෙස අර්ථකථනය කළ හැකිය.**

සංකල්පයක් ලෙස,

ආණ්ඩුව යනු , ඇසට පෙනෙන (දෘශ්‍ය) , වෙනස් වන (අස්ථාවර), හැඟීම් ඇති , ප්‍රායෝගික ක්‍රියාකාරීත්වක් සහිත සචේතනික සංකල්පයක් වේ.

නිර්වචන,

ආණ්ඩුව යනු , කුමක්දැයි හඳුනාගැනීම සඳහා ආණ්ඩුව සම්බන්ධයෙන් දේශපාලන විද්‍යා ලිඛිත සාහිත්‍යය තුළ පළවී ඇති නිර්වචන ද වැදගත් වේ.

- ආණ්ඩුව සම්බන්ධයෙන් පළවී ඇති පොදු නිර්වචන

**"ආණ්ඩුව යනු, රාජ්‍යය පාලනය කරන පුද්ගල හෝ පුද්ගල කණ්ඩායමේ එකතුවකි."**

**"යම් ප්‍රජාවක් තුළ අධිකාරීබලය සහිතව සම්බන්ධතා මෙහෙය වන ආයතනය "**

**"ආණ්ඩුව යනු නීතිය හා පරිපාලනය සිදුකරන ආයතනය වේ."**

**"සමාජ කළමණාකරණය කිරීමට යොදා ගන්නා පාලන ආකෘතිය ආණ්ඩුව වේ."**

- ආණ්ඩුව සම්බන්ධයෙන් පළවී ඇති දාර්ශනික නිර්වචන

**" රාජ්‍යයේ හෝ මහජනතාවගේ කැමැත්ත ප්‍රතිපත්ති වලට හැරවීමත් , ක්‍රියාවට නැඟීමත් කරනු ලබන නියෝජිතයා ආණ්ඩුව වේ."** -ගානර්-

**"ආණ්ඩුව පවතින්නේ රාජ්‍යය අරමුණු ක්‍රියාවට නැඟීමට වේ."** -ලැස්කි-

**" රාජ්‍යය සතු බලය ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන සකල සංවිධාන ජාලයේ එකතුව ආණ්ඩුව වේ."** -ජෝන් සිලී-

ආණ්ඩුව යනු කුමක්දැයි තවදුරටත් හඳුනාගැනීම සඳහා ආණ්ඩුව නාමකරණයට දේශපාලන විද්‍යාව තුළ භාවිතා කරන පාරිභාෂික වාක් සංකේත හෙවත් සාහිත්‍යමය විවරණයන් යොදාගත හැකි ය.

ආණ්ඩුව යනු ,

**"රාජ්‍යයේ ක්‍රියාකාරී අංශය වේ."**

**"රාජ්‍යයේ සංවිධානාත්මක අංශය වේ.**

**"රාජ්‍යයේ ප්‍රායෝගික හස්තය වේ."**

**"රාජ්‍යයේ ක්‍රියාකාරී මෙවලම වේ."**

**"රාජ්‍යයේ අභිමතය ප්‍රකාශ කිරීමේත් මෙහෙයවීමේත් මාධ්‍යය වේ."**

**"රාජ්‍යය තුළ නීතිය හා සාමය ආරක්ෂා කරමින් ජනතාව පොදු අරමුණු කරා මෙහෙයවන්නා වේ."**

ආණ්ඩුව හැඳින්වීම සඳහා භාවිත කරන සාහිත්‍යමය විවරණයන් මගින් පැහැදිලි වන්නේ රාජ්‍යයේ සෑම කාර්යයක් ම සිදු කරන්නේ ආණ්ඩුව බවයි. එම නිසා **න්‍යායික තලයේදී** "රාජ්‍යය ස්වාමියා ලෙසත් ආණ්ඩුව සේවකයා ලෙසත්" දේශපාලන විද්‍යාව තුළ විවරණය වේ.

න්‍යායික විග්‍රහය තුළ රාජ්‍යය ස්වාමියා ලෙස ද ආණ්ඩුව සේවකයා ලෙස ද නිර්වචනය කරන මුත් **ප්‍රායෝගික තලයේ** "ආණ්ඩුව ස්වාමියා වී රාජ්‍යය සේවකයෙකු බවට පත් වේ." ඊට අදාළ නිදර්ශන ,

නිදර්ශන ප්‍රායෝගික තලයේදී රාජ්‍යයේ සෑම දෙයක්ම තීරණය කරනු ලබන්නේ ආණ්ඩුව විසිනි. **රාජ්‍යය විසින් පිළිගතයුතු ආර්ථික ප්‍රතිපත්තිය, රාජ්‍යයේ දේශපාලන ප්‍රතිපත්තිය , රාජ්‍යයේ විදේශ ප්‍රතිපත්තිය** වැනි ජාතික වශයෙන් වැදගත් සියලු ප්‍රතිපත්ති තීරණය කරනු ලබන්නේ ආණ්ඩුව විසිනි.

රාජ්‍යය පාලනය සඳහා අවශ්‍යය නීති , රෙගුලාසි , තීරණය කිරීම , සම්පාදනය කිරීම , ක්‍රියාවට නැගීම සිදුකරනු ලබන්නේ ආණ්ඩුව විසිනි.

ඉහත විග්‍රහයෙන් පැහැදිලි වන්නේ ප්‍රායෝගික තලය තුළ **ආණ්ඩුව ස්වාමියා වී රාජ්‍යය සේවකයා** වන බවයි. එසේම **ආණ්ඩුව ස්වකීය වැඩකටයුතු (කෘත්‍යයන්) රාජ්‍යයේ නාමයෙන් ක්‍රියාත්මක කොට එම වැඩකටයුතු වලට පොදු බවක් ආරෝපණය කිරීමට උත්සාහගනී.**

ආණ්ඩුවේ ව්‍යූහය

ආණ්ඩුව යනු කුමක්දැයි හඳුනාගැනීමට අදාළ සංවාදය තුළදී ආණ්ඩුවේ ආයතනික ව්‍යූහය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වැදගත් වේ. **ආණ්ඩුවේ ව්‍යූහය ප්‍රධාන කොටස් තුනකි.**

| | | |
|---|---|---|
| ව්‍යවස්ථාදායකය | - | නීති සම්පාදන ආයතනය |
| විධායකය | - | නීති ක්‍රියාත්මක කරන ආයතනය |
| අධිකරණය | - | නීති විනිශ්චය කරන ආයතනය |

ආණ්ඩුව කොටස් තුනකින් සමන්විත වුව ද ප්‍රායෝගික ජනප්‍රිය දේශපාලන සංවාද තුළ , ලේඛන තුළ ආණ්ඩුව ලෙස හඳුනාගනු ලබන්නේ නීති ක්‍රියාත්මක කරන ආයතනය වන විධායකය පමණි.

විවිධ ආණ්ඩු වර්ග

ආණ්ඩුව හඳුනාගැනීමට අදාළව සංවාදය තුළ මීළඟට අවධානය යොමු කරනු ලබන්නේ නූතන ජාතික රාජ්‍යයන් තුළ ක්‍රියාත්මක වන ආණ්ඩු වර්ග පිළිබඳ සටහන් තැබීමට ය. ප්‍රධාන තේමාවන් තුනක් යටතේ ආණ්ඩු වර්ග කළ හැකිය.

| | | | |
|---|---|---|---|
| 01. | දේශපාලන න්‍යාය මත | ලිබරල් ප්‍රාජාතන්ත්‍රවාදී ආණ්ඩු | (බ්‍රිතාන්‍යය) |
| | | සමාජවාදී ආණ්ඩු | (රුසියාව) |
| | | ෆැසිස්ට්වාදී ආණ්ඩු | (ඉතාලිය) |
| | | සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු | (ලංකාව) |
| 02. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය බෙදා හැර ඇති ආකාරය මත | ඒකීය ආණ්ඩු | (බ්‍රිතාන්‍යය) |
| | | සංඝීය ආණ්ඩු | (ඇමරිකාව) |
| 03. | විධායකයේ ස්වරූපය මත | ජනාධිපති ආණ්ඩු | (ඇමරිකාව) |
| | | කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩු | (බ්‍රිතාන්‍යය) |
| | | මිශ්‍ර ආණ්ඩු | (ලංකාව) |
| | | ඒක තන්ත්‍ර ආණ්ඩු | (මියන්මාරය) |

ආණ්ඩුව හඳුනාගැනීමට අදාළව තවදුරටත් , ආණ්ඩුවේ බලය - ආණ්ඩුවේ බලය ක්‍රියාවට නගන විධික්‍රම - ආණ්ඩුවේ බලය සංවරණය කිරීමේ මාර්ග - ආණ්ඩුවේ කාර්යය භාරය , ආණ්ඩුවේ බලය යෙදීමේ උපකරණ - ආණ්ඩුව අනෙකුත් සමාජ සංවිධාන වලින් වෙනස් වන ආකාරය සම්බන්ධයෙන් අධ්‍යයනය කළ යුතුය.

# ආණ්ඩුව සමාජ සංවිධානයක් ලෙස අනෙකුත් සමාජ සංවිධාන වලින් වෙනස් වන ආකාරය

## **ආ**ණ්ඩුව සමාජ සංවිධානයක් ලෙස අනෙකුත් සමාජ සංවිධාන වලින් වෙනස් වන ආකාරය

හැඳින්වීම

ආණ්ඩුව අනෙකුත් සංමාජ සංවිධාන වලින් වෙනස් වන ආකාරය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට පූර්වයේ ආණ්ඩුව හා අන්‍යය සමාජ සංවිධාන නිර්වචනය කිරීම වැදගත් වේ.

ආණ්ඩුව යනු ,

- ආණ්ඩුව සමාජ සංවිධානය කි.
- රාජ්‍යයේ ක්‍රියාකාරී අංශය - සංවිධානාත්මක අංශය - ප්‍රායෝගික හස්තය වන්නේ ආණ්ඩුවයි.
- ආණ්ඩුවේ ව්‍යුහය කොටස් තුනකි. ව්‍යවස්ථාදායකය - විධායකය - අධිකරණය නමුත් ප්‍රායෝගික තත්ත්වයේදී ආණ්ඩුව ලෙස හඳුනාගනු ලබන්නේ විධායකය පමණි.

( N.B ආණ්ඩුවට අදාළ නිර්වචන ද මෙහිදී දක්වන්න.)

**අන්‍යය සංවිධාන - ස්වේච්ඡා සමාගම් යනු**

- විශේෂිත අරමුණක් හෝ අරමුණු කිහිපයක් වෙනුවෙන් ස්වකීය කැමැත්තෙන් එකට එකතු වූ මිනිස් සමූහය ස්වේච්ඡා සංවිධානයක් ලෙස සරලව නිර්වචනය කළ හැකිය.
- ස්වේච්ඡා සමාගම් අයත් වන්නේ ද සමාජ සංවිධාන කුලකයට යි.
- අන්‍යය සංවිධාන එකිනෙකට වෙනස් අරමුණු මත සංවිධාන ගතවී ඇති ආකාරය හඳුනාගත හැකිය.
- අන්‍යය සමාජ සංවිධාන වලට අදාළ <u>නිදර්ශන</u> ලෙස, **ක්‍රීඩා සමාජ - යෞවන සමාජ - මරණාධාර සමිති - ස.ණ.ස - මහිලා සමිති - සර්වෝදය** ආදිය දැක්විය හැකිය.

■ **<u>ආණ්ඩුව නැමති සමාජ සංවිධානය හා අන්‍යය සමාජ සංවිධාන අතර වෙනස පැහැදිලි කිරීම.</u>**

ආණ්ඩුව සමාජ සංවිධානයකි. යෞවන සමාජ - ක්‍රීඩා සමාජ - සර්වෝදය ආදී සංවිධාන අන්‍යය සංවිධාන වලට නිදසුන් ය. පොදුවේ මේ සියල්ල සමාජ සංවිධාන කුලකයට අයත් වෙයි. <u>නමුත් ආණ්ඩුව හා අන්‍යය සංවිධාන අතර ඉතා පැහැදිලි වෙනස්කම් හඳුනාගත හැකිය</u>.

ඒවා නම් ,

- <u>බලය</u>

බලය යන සාධකය මත ආණ්ඩුව හා අන්‍යය සංවිධාන අතර ඉතා පැහැදිලි වෙනසක් හඳුනාගත හැකිය. බලය යන සාධකය තවදුරටත් ආංශිකව විග්‍රහ කළ හැකිය.

බලයේ ප්‍රමාණය මත
බලය ක්‍රියාවට නගන උපකරණ මත
මැදිහත්වීමේ බලය මත

<u>බලයේ ප්‍රමාණය මත</u>

<u>ආණ්ඩුවට විශාල බලයක් හිමිවේ. නමුත් අන්‍යය සංවිධාන වලට ඇත්තේ ඉතා කුඩා සීමිත බලයක් පමණි.</u> ආණ්ඩුවට ස්වාධිපත්‍ය බලය හිමි නොවේ. ස්වාධිපත්‍ය බලය හිමිවන්නේ රාජ්‍යයට ය. නමුත් ආණ්ඩුව යනු **රාජ්‍යය සතු ස්වාධිපත්‍ය බලයේ තනි උරුමකරුවා ය.** රාජ්‍යය සතු ස්වාධිපත්‍යය බලය ක්‍රියාවට නංවන **ඒජන්තවරයා** වන්නේ ආණ්ඩුවයි. රාජ්‍යයට හිමි **ස්වාධිපත්‍යය බලය - පරම බලය - උත්තරීතර බලය - අසහාය බලය** ක්‍රියාත්මක කරන **හස්තය** වන්නේ ආණ්ඩුවයි. රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය භාවිතා කරමින් ආණ්ඩුව විසින් මුළු රාජ්‍යයටම බලපාන ආකාරයට ව්‍යවස්ථාදායකය , විධායක , අධිකරණ කටයුතු ක්‍රියාත්මක කරයි. එම නිසා රාජ්‍යයේ ප්‍රායෝගික හස්තය වන්නේ ආණ්ඩුවයි. එම තත්ත්වය දේශපාලන විද්‍යාව තුළ ඇති අපූරු සාහිත්‍යමය ප්‍රකාශනයකින් දක්වන්නේ නම්,

**"රාජ්‍යය ස්වාමියා වේ. ආණ්ඩුව සේවකයා වේ."**

<u>න්‍යායික තත්ත්වයේදී</u> රාජ්‍යය ස්වාමියා වේ. ආණ්ඩුව සේවකයා බවට පත්වේ. නමුත්, <u>ප්‍රායෝගික භාවිතය</u> තුළ සිදුවන්නේ **<u>රාජ්‍යය සේවකයා වී ආණ්ඩුව ස්වාමියා බවට පත්වීම</u>** යැයි දේශපාලන විද්‍යාඥයින් මත පළ කරයි. මෙම තත්ත්වය මත ආණ්ඩුව නැමති සමාජ සංවිධානයට විශාල බලයක් උරුම බව පැහැදිලි වේ.

<u>අන්‍යය සංවිධාන වලට හිමිවන්නේ ආණ්ඩුවට සාපේක්ෂව ඉතා කුඩා බලයකි.</u> ස්වකීය සමාජිකයන් කෙරෙහි යෙදවිය හැකි ඉතා සීමිත බලයක් පමණක් අන්‍යය සංවිධාන බුක්ති විඳී. ආණ්ඩුවේ බලයට යටත්ව පැවතීමට අන්‍යය සංවිධාන වලට සිදුවේ.

<u>බලය ක්‍රියාවට නංවන උපකරණ මත.</u>

<u>ආණ්ඩුවේ බලය ක්‍රියාවට නැංවීම සඳහා නෛතික උපකරණ පවතී. නමුත් අන්‍යය සංවිධාන වලට එවැනි උපකරණ නොමැත.</u> ආණ්ඩුවේ බලය ක්‍රියාවට නැංවීම සඳහා පවතින <u>නෛතික උපකරණ, මෙවලම් , මාර්ග , විධික්‍රම</u> ලෙස **පොලීසිය - හමුදාව - බන්ධනාගාර - හිරගෙවල් - පෝරක - තුවක්කුව - සිවිල් සේවය** ආදිය දැක්විය හැකිය. නමුත් අන්‍යය සංවිධාන වලට හිමි සීමිත කුඩා බලය ක්‍රියාවට නැංවීම සඳහා එවැනි නෛතික උපකරණ විධික්‍රම , මෙවලම් , නොමැත.

මැදිහත්වීමේ බලය මත.

ආණ්ඩුවට මැදිහත්වීමේ බලය පවතී. අන්‍යය සංවිධාන වලට මැදිහත්වීමේ බලයක් නොමැත. ආණ්ඩුවට රාජ්‍යය තුළ සිදුවන ඕනෑම කාර්යයක් සම්බන්ධයෙන් මැදිහත්වීමට , සොයා බැලීමට , පරීක්ෂණ පැවැත්වීමට , විමසීමට බලය ඇත. නමුත් අන්‍යය සංවිධාන වලට එවැනි මැදිහත්වීමේ බලයක් නොමැත. ස්වකීය සංවිධානයේ කටයුතු වලින් වියෝජනය වූ කිසිඳු කාර්යයකට මැදිහත්වීමට අන්‍යය සංවිධාන වලට බලය නොමැත.

- දඬුවම්

දඬුවම් යන සාධකය මත ආණ්ඩුව හා අන්‍යය සංවිධාන අතර වෙනසක් හඳුනාගත හැකිය. ආණ්ඩුව පැනවූ නීති කඩකරන ඕනෑම පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට **දඬගැසීම - නඩු පැවරීම - සිරගත කිරීම - මරණදණ්ඩනය** වැනි නෛතික පදනමක් සහිත දඬුවම් ආණ්ඩුව ලබාදෙයි. පුද්ලයාගේ **ජීවිතය - මරණය** අතර ඕනෑම දඬුවමක් ලබාදීමේ **සුජාතභාවයේ** බලය ආණ්ඩුව බුක්තිවිඳියි. නමුත් අන්‍යය සංවිධාන වලට ස්වකීය සංවිධානයේ නෛතික පදනම බිඳ දමන සාමාජිකයෙකුට දියහැකි උපරිම දණ්ඩනය වන්නේ **සාමාජිකත්වය අහෝසි කිරීම පමණි.** මෙම ආකාරයට දඬුවම් මත ආණ්ඩුව හා අන්‍යය සංවිධාන වෙනස් වේ.

- අවනතභාවය

ආණ්ඩුව හා අන්‍යය සංවිධාන අවනතභාවය යන සාධකය මත වෙනස් වේ. **න්‍යායික තත්ත්වය** තුළ පුද්ගලයා ආණ්ඩුවට අවනතවීමට බැඳී නැත. අවනත විය යුත්තේ රාජ්‍යයට පමණි. නමුත් **ප්‍රායෝගික භාවිතය** තුළ පුද්ගලයාට රාජ්‍යයට මෙන්ම ආණ්ඩුවට අවනතවීමට සිදුවේ. ආණ්ඩුව විසින් උපක්‍රමික ලෙස රාජ්‍යය යාන්ත්‍රණය හසුරුවමින් සියළු පුරවැසියන් අවනතකරවා ගැනීමට කටයුතු කරයි. නමුත් අන්‍යය සංවිධාන වලට අවනත කරගැනීමේ හැකියාව ඇත්තේ ස්වකීය සංවිධානයේ සාමාජිකයන් පමණි. එසේ වුව ද බලහත්කරය මගින් අවනතකරගැනීමේ හැකියාව අන්‍යය සංවිධාන වලට නොමැත. අන්‍යය සංවිධාන වලට ඇති අවනතභාවය ස්වෙච්ඡාත්මක හැඩයක් ගනී.

මෙම ආකාරයට අවනතාභාවය යන සාධකය මත ආණ්ඩුව හා අන්‍යය සංවිධාන අතර ඉතා පැහැදිලි වෙනසක් විශද වෙයි.

- සාමාජිකත්වය

සාමාජිකත්වය යන සාධකය මත ආණ්ඩුව හා අන්‍යය සංවිධාන අතර වෙනසක් හඳුනාගත හැකිය. සාමාජිකත්වය යන සාධකය තවදුරටත් ආංශිකව විග්‍රහ කළ හැකිය.

සාමාජිකත්වයට හිමිව ඇති නාමකරණය මත

සාමාජිකත්වයෙන් නියෝජනය වන දෙය මත

සාමාජිකත්වයට හිමිව ඇති නාමකරණය මත

ආණ්ඩුවේ සාමාජිකයන් හඳුන්වනු ලබන සම්මුති නාමකරණයක් පවතී. නමුත් අන්‍යය ස්වේච්ඡා සමාගම් වල සාමාජිකත්වය හැඳින්වීම සඳහා එවැනි සම්මුති නාමකරණයක් නොමැත. **ආණ්ඩුවේ සාමාජිකයන් යනු,** ව්‍යවස්ථාදායක , විධායක හා අධිකරණ යන ත්‍රිවිධ අංශ වල වගකීම් හා කාර්යයන් පැවරී ඇති පිරිසයි. නමුත් ප්‍රායෝගික තත්ත්වයේදී ආණ්ඩුව බවට පත්වන්නේ විධායකය යි. **විධායකයේ සාමාජිකයන් හඳුන්වන දේශපාලන විද්‍යා පාරිභාෂික වාක් සංකේතය වන්නේ "පාලකයන්" යන්න වේ.** නමුත් ස්වේච්ඡා සමාගම් වල සාමාජිකයන් හැඳින්වීම සඳහා අනන්‍ය වූ පාරිභාෂික වාක් සංකේතයක් නොමැත.

මෙම ආකාරයට සාමාජිකත්වය යන සාධකය මත ආණ්ඩුව හා අන්‍යය සංවිධාන අතර වෙනස්කම් ගම්‍යමාන වේ.

සාමාජිකත්වයෙන් නියෝජනය වන දෙය මත

ආණ්ඩුවේ සාමාජිකත්වය තුළින් නියෝජනය වන්නේ ජනතා මතයයි. නමුත් අන්‍යය සංවිධාන වල සාමාජිකත්වය තුළින් එවැන්නක් නියෝජනය නොවේ. ප්‍රායෝගික තලයේදී ආණ්ඩුව ලෙස සලකන විධායකයේ සාමාජිකයෙකු බවට පත්වන්නේ ජනතා නියෝජිතයන් ය. නමුත් අන්‍යය සංවිධාන වල සාමාජිකත්වය ලබා ගන්නේ එවැනි පදනමක් මත නොවේ. එහි සාමාජිකත්වය ස්වකීය අභිමතය පරිදි ලබා ගැනීමට පුද්ගලයාට හැකිය.

මෙම ආකාරයට සාමාජිකත්වය යන සාධකය මත ආණ්ඩුව හා අන්‍යය සංවිධාන අතර වෙනස්කම් සාකච්ඡා කළ හැකිය.

- අරමුණු (පරමාර්ථ)

ආණ්ඩුව යන සමාජ සංවිධානය හා අන්‍යය සංවිධාන අතර වෙනස්කම් අරමුණු යන සාධකය මත ද ගම්‍යමාන වේ. අරමුණු යන සාධකය තවදුරටත් ආංශිකව විග්‍රහ කළ හැකි ය.
අරමුණු වල ස්වභාවය මත.
අරමුණු වල වැදගත්භාවය මත.

අරමුණු වල ස්වභාවය මත.

රාජ්‍යයට ඇත්තේ පොදු අරමුණුය. එම නිසා රාජ්‍යයේ හස්තය වන ආණ්ඩුව ද ක්‍රියාත්මක වන්නේ පොදු අරමුණු වෙනුවෙනි. නමුත් අන්‍යය සංවිධාන වලට ඇත්තේ සීමිත අරමුණු වේ.

**ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ ආභාෂය** සමඟ පක්ෂ දේශපාලනයක් නූතන අවධිය තුළ ක්‍රියාත්මක වේ. එම නිසා ආණ්ඩුව නිර්මානය වන්නේ බහුතර බලය දිනාගත් දේශපාලන පක්ෂයෙනි. එම නිසා ආණ්ඩුව න්‍යායික තත්ත්වය තුළදී පොදු සමාජ සංවිධානයක් ලෙස අර්ථකතනය කිරීමට අපහසු ය. **නමුත් ආණ්ඩු බලයට පත්වීමෙන් අනතුරුව ක්‍රියාත්මක වන්නේ ස්වකීය පක්ෂයේ සාමාජිකයන්ගේ අරමුණු සඳහා පමණක් නොව සමස්ත ජාතිය වෙනුවෙනි.**

එම නිසා ආණ්ඩුවේ අරමුණු , පරමාර්ථ පොදු අරමුණු හා පොදු පරමාර්ථ බවට පත්වේ.
නිදර්ශන ලෙස ,

**නීතිය හා සාමය රැකීම.**
**සුබසාධනය ක්‍රියාත්මක කිරීම.**

ආදිය ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කරන පොදු පරමාර්ථ , අරමුණු බවට පත්වෙයි. සමස්ත ජාතිය වෙනුවෙන් සකස් වූ අරමුණු පරමාර්ථ ආණ්ඩුව විසින් ක්‍රියාවට නගයි. **ජාතික ආර්ථිකය සංවර්ධනය - ජාතික ආරක්ෂාව තහවුරු කිරීම - ජාතික සුබසාධනය වර්ධනය කිරීම - ජාතියේම සාමාජීය තත්ත්වය නගාලීම** වැනි පොදු අරමුණු ආණ්ඩුව නැමති සමාජ සංවිධානයට තිබිය යුතු ය.

නමුත් අන්‍යය සංවිධාන වලට ඇත්තේ සීමිත අරමුණු පමණි. ස්වකීය සාමාජිකත්වය මත පදනම් වූ අරමුණු හා පරමාර්ථ අන්‍යය සංවිධාන වලට ඇත. එම අරමුණු වල ස්වභාවය බොහෝ විට සීමිත , හැකිළුණු , පටු ස්වභාවයක් ගනී.

අරමුණු වල ස්වභාවය මත

ආණ්ඩුවේ අරමුණු වඩා වැදගත් වේ. අන්‍යය සංවිධාන වල අරමුණු ආණ්ඩුවේ අරමුණු වලට සාපේක්ෂව වැදගත් භාවය සීමිතය. ආණ්ඩුවේ අරමුණු වඩා වැදගත් වීම ඒ සඳහා බලපෑ හේතු සාධක කිහිපයකි.

i **ආණ්ඩුවට ඇත්තේ පොදු අරමුණුවීම නිසා.**

ii **ආණ්ඩුවේ අරමුණු ඉටුවන ප්‍රමාණය මත ස්වේච්ඡා සමාගම් වල අරමුණු ඉටුවීම තීරණය වන නිසා.**

iii **ආණ්ඩුවේ අරමුණු වලට යටත්ව අන්‍යය සංවිධාන වලට ස්වකීය අරමුණු ඉටුකර ගැනීමට සිදුවන නිසා**

මෙම තත්ත්වය මත අන්‍යය සංවිධාන වල අරමුණු ආණ්ඩුවේ අරමුණු වලට සාපේක්ෂව වැදගත් නොවේ. මෙම ආකාරයට අරමුණු මත ආණ්ඩුව හා අන්‍යය සංවිධාන වෙනස්වේ.

ඉහත ආකාරයට ආණ්ඩුව නැමති සමාජ සංවිධානය හා අන්‍යය සංවිධාන බලය - දඬුවම් - සාමාජිකත්වය - අවනතභාවය - අරමුණු යන සාධක මත වෙනස් බව ප්‍රත්‍යක්ෂ වේ.

# ආණ්ඩුවේ බලය

ආණ්ඩුවේ බලය යන්නෙන් අර්ථවත් වන්නේ, සංකේතවත් වන්නේ රාජ්‍යය සතු ස්වාධිපතිපත්‍ය බලය **ක්‍රියාත්මක** කිරීමට ඇති නෛතික ශක්‍යතාවයයි. ආණ්ඩුවට ස්වාධිපත්‍යය බලය හිමිනොවේ. ස්වාධිපත්‍ය බලය හිමිවන්නේ රාජ්‍යයටයි. වෙනත් කිසිඳු ආයතනයක ස්වාධිපත්‍ය බලය - පරමබලය - අසහාය බලය - උත්තරීතර බලය හිමි නොවේ.

ස්වාධිපත්‍ය බලය යනු,

- "මුළු රාජ්‍යයටම බලපාන ආකාරයට ව්‍යවස්ථාදායකය , විධායකය , අධිකරණ කටයුතු ක්‍රියාත්මක කිරීමට රාජ්‍යය සතු හැකියාවයි."
- "මුළු රාජ්‍යයටම බලපාන ආකාරයට නීති සම්පාදනය කිරීමටත්, නීති ක්‍රියාත්මක කිරීමටත් , නීති විනිශ්චය කිරීමටත් ඇති හැකියාව ස්වාධිපත්‍යය යන්නෙන් සංකේතවත් වේ."

- ස්වාධිපත්‍ය සංකල්පය දේශපාලන විද්‍යාවට එක් කරනු ලබන්නේ 1576 දී ජීන් බොඩෑන් විසිනි. ඔහු ස්වාධිපත්‍යය විග්‍රහ කරනු ලබන්නේ,

  **"කිසිඳු නීතියකින් සීමා නොවුණු යටත් වැසියන් කෙරෙහි යෙදවිය හැකි රාජ්‍යය සතු උත්තරීතර හා පරම බලය ස්වාධිපත්‍යය බලය වේ."**

  **-ජීන් බොඩෑන්-**

  **(රාජ්‍යය පිළිබඳ සම්මුතීන් හයක්)**

**රාජ්‍යය සතු ස්වාධිපත්‍ය බලය ක්‍රියාවට නැගීමට රාජ්‍යයට නොහැකිය.** රාජ්‍යය අචේතනික,ඇසට නොපෙනෙන (අදෘශ්‍යය), හැඟීම් නොමැති , ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයක් නොමැති සංකල්පයකි. එම නිසා රාජ්‍යය වෙනුවෙන් සෑම ක්‍රියාවක්ම සිදු කරනු ලබන්නේ ආණ්ඩුවයි. එම නිසා රාජ්‍යය සතු ස්වාධිපත්‍යය බලයේ **තනි උරුම කරුවා** වන්නේ ආණ්ඩුවයි.

වෙනත් ලෙසකින් දක්වන්නේ නම් රාජ්‍යය ස්වාධිපත්‍ය බලය ක්‍රියාත්මක කිරීමේ **නෛතික අයිතිය ඇති ඒජන්තවරයා** ආණ්ඩුවයි. මේ ආකාරයට රාජ්‍යය වෙනුවෙන් ව්‍යවස්ථාදායක , විධායක , අධිකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම ආණ්ඩුව විසින් සිදුකරයි. ආණ්ඩුවට ස්වාධිපත්‍යය බලය හිමි නොවුන ද **රාජ්‍යයට හිමි ස්වාධිපත්‍යය බලය - පරම බලය - අසහාය බලය - උත්තරීතර බලය ක්‍රියාවට නංවන හස්තය වන්නේ ආණ්ඩුවයි.** එම නිසා ආණ්ඩුවේ බලය යන්නෙන් සංකේතවත් වන්නේ රාජ්‍යය සතු ස්වාධිපත්‍යය බලය ක්‍රියාත්මක කිරීමේ නෛතික ශක්‍යතාවයයි.

# ආණ්ඩුවේ බලය ක්‍රියාවට නැංවීමේ විධික්‍රම

# ආ ණ්ඩුවේ බලය ක්‍රියාවට නැංවීමේ විධික්‍රම

හැඳින්වීම.

ආණ්ඩුවේ බලය යන්නෙන් සංකේතවත් වන්නේ රාජ්‍යය සතු ස්වාධිපත්‍යය බලය ක්‍රියාවට නැංවීමේ නෛතික හිමිකමයි. ආණ්ඩුව කුමන ස්වරූපයකින් ක්‍රියාත්මක වුව ද ආණ්ඩුව මුහුණ දෙන ප්‍රධානම අභියෝගය වන්නේ ජනතාව තමන් වෙත අවනත කරගන්නේ කෙසේද යන්නයි. නිදර්ශනයක් ලෙස දක්වන්නේ නම් ආණ්ඩුවඒකාධිපති වුව ද ප්‍රජාතන්ත්‍රවාදී වුව ද ආණ්ඩුව කෙරෙහි ජනතාව අවනත කරගැනීමට - නම්මවා ගැනීමට විවිධ ක්‍රම භාවිතා කරයි. එම ක්‍රම , මූලධර්ම හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ බලය ක්‍රියාවට නංවන විධික්‍රම යනුවෙනි.

ක්‍රම

- ## ආණ්ඩුවේ බලය ක්‍රියාවට නංවන විධික්‍රම
  <u>(ජනතාව ආණ්ඩුව වෙත අවනත කරවා ගැනීම සඳහා භාවිතා කරන මූලධර්ම)</u>

### i ආණ්ඩුවේ ක්‍රියාවන් හි සුජාතභාවය - යහපත් බව - ශුද්ධත්වය - ජනතාවට ඒත්තු ගැන්වීම.

ආණ්ඩුව ජනතාවගේ වරමින් පත් වූ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් බව පෙන්වීම. ආණ්ඩුව ක්‍රියාත්මක වන්නේ සමස්ත ජාතිය වෙනුවෙන් සහ රාජ්‍යය වෙනුවෙන් බව ඒත්තු ගැන්වීම. ආණ්ඩුව නීති සම්පාදනය කරන්නේත් නීති ක්‍රියාත්මක කරන්නේත් නීති විනිශ්චය කරන්නේත් සමස්ත සමාජයේ පොදු යහපත වෙනුවෙන්ය යන මනෝභාවය ව්‍යාප්ත කිරීම. එම නිසා පුරවැසියන් පළමුව රාජ්‍යයට ද දෙවනුව ආණ්ඩුවට ද අවනත විය යුතුය යන මතවාදය ජනතා මනස තුළ ස්ථාපනය කිරීමට ආණ්ඩුව උත්සාහ දරයි. මෙවැනි තත්ත්වයන් ජනතාවට ඒත්තු ගැන්වීම මතින් ස්වේච්ඡාවෙන් ජනතාව ආණ්ඩුව වෙතට අවනත කරගැනීමට ආණ්ඩුව උත්සාහ දරයි. මෙම ආකාරයට ආණ්ඩුවේ කාර්යයන් හි සුජාතභාවය - යහපත් බව - ශුද්ධත්වය - පරමභාවය ජනතාවට ඒත්තු ගැන්වීම ආණ්ඩුවේ බලය ක්‍රියාවට නැගීම සඳහා භාවිතා කරන විධික්‍රමයකි.

### ii කැරට් සහ කෝටු න්‍යාය

කැරට් සහ කෝටුව භාවිතය පිළිබඳ න්‍යායෙන් නිර්වචනය වන්නේ <u>ආණ්ඩුවට අවනත - පක්ෂපාතී - හිතවත් - මිත්‍රශීලී පුරවැසියන්ට යහපත් ප්‍රතිධානත් ආණ්ඩුවට විරුද්ධ - අපක්ෂපාතී - අහිතවත් - අමිත්‍ර පුරවැසියන්ට අයහපත් ප්‍රතිධානත් සම්පාදනය කරන යාන්ත්‍රණයයි.</u>

නිදර්ශන — ආණ්ඩුවට පක්ෂපාතීන් යහපත් පුරවැසියන් ලෙස අර්ථකතනය කරමින් නම්බුනාම - රැකියා - රැකියා උසස්වීම් - තනතුරු ආදිය ප්‍රදානය කරමින් ඔවුන් ප්‍රහර්ෂයට පත්කිරීම.

නිදර්ශන ආණ්ඩුවට අපක්ෂපාතීන් අයහපත් පුරවැසියන් ලෙස අර්ථකතනය කරමින් රාජ්‍යය තනතුරු නොදීම - රැකියා ලබානොදීම - රැකියා මාරුවීම් ලබාදීම - නම්බුනාම ප්‍රදානය නොකිරීම - විවිධ චෝදනා එල්ල කරමින් බන්ධනාගාරගත කිරීම - රාජ්‍යය ද්‍රෝහීන්යැයි නම් කිරීම - රාජ්‍යයෙන් පිටුවහල් කිරීම - මූල්‍යාධාර අත්හිටුවීම - ඡන්ද බලය අහෝසි කිරීම - පාඨශාලාවලින් පන්නාදැමීම - විශ්ව විද්‍යාල වලින් පන්නා දැමීම - ව්‍යාපෘතියකට හෝ ව්‍යාපාරකයට අවශ්‍ය බලපත්‍ර ප්‍රදානය නොකිරීම ආදී තත්ත්වයන්ට මුහුණදීමට සැලැස්වීම.

## iii සෘජු වාරණය

ආණ්ඩුව බලය යෙදීම සඳහා භාවිතා කරන තවත් මූලධර්මයක් වන්නේ සෘජු වාරණයයි. වාරණය යන්නෙහි සංකේතික අර්ථය වන්නේ මර්ධනය යි. ආණ්ඩුව විසින් සෘජු මර්ධන යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම මගින් ජනතාව බලහත්කාරයෙන් තමන්වෙත අවනත කරවාගැනීමේ ශක්‍යතාවයෙන් යුක්තය. ස්වාධිපත්‍ය බලය ක්‍රියාවට නැගීමේ තනි උරුමකරුවා වශයෙන් ආණ්ඩුවට ඕනෑම වාරණයක් අවශ්‍යය මොහොතකදී ක්‍රියාවට නැගීමේ අවකාශය නෛතික මට්ටමෙන් පවතී. <u>ආණ්ඩුවට යෙදිය හැකි වාරණය විවිධ ස්වරූප ගනී.</u>

නිදර්ශන

- භෞතික වාරණ - දඬුවම් කිරීම , සිරගත කිරීම , දේපල රාජසන්තක කිරීම.
- ආර්ථික වාරණ - ව්‍යාපෘතියක් සඳහා අවශ්‍යය බලපත්‍රය ලබානොදීම.
- මානසික වාරණ - රැකියාවේ උසස්වීම් බලානොදීම.
- හිංසාකාරී වාරණ- සියලු වාරණයන් හිංසාකාරීය.

## iv සම්මුතිය (එකඟතාවය)

ආණ්ඩුව විසින් බලය ක්‍රියාවට නගන තවත් විධික්‍රමයක් වන්නේ සම්මුතීන් , එකඟතාවයන් ය. ආණ්ඩුව පුද්ගලයන් හා ආයතන සමඟ එකඟතාවයන්ට එළඹීම මගින් ස්වකීය බලය ක්‍රියාවට නගයි. එම නිසා සම්මුතීන් ද ආණ්ඩුවේ බලය ක්‍රියාවට නංවන එක් මාධ්‍යයක් ලෙස හඳුනාගත හැකිය.

## v බියගැන්වීම හා බලපෑම් කිරීම.

ආණ්ඩුවේ බලය ක්‍රියාවට නංවන තවත් විධික්‍රමයක් වන්නේ බිය ගැන්වීම හා බලපෑම් කිරීමයි. ආණ්ඩුවට විරුද්ධවීම නිසා උදාවියහැකි තත්ත්වයන් සම්බන්ධයෙන් බියගැන්වීම , ආණ්ඩුවට අවනත වන ලෙස බලපෑම් කිරීම

ආණ්ඩුවේ නීති කඩකරන පුද්ගලයන්ට අත්විය හැකි තත්ත්වයන් සම්බනන්ධයෙන් බියගැන්වීම. එම තත්ත්වයන් පිළිබඳ පැහැදිලි කරමින් බලහත්කාරය , බලපෑම් කිරීම මගින් ආණ්ඩුව වෙත ජනතාව අවතන කරගැනීමට අදාළ පදනම නිර්මාණය කරයි. එම නිසා බියගැන්වීම හා බලපෑම් කිරීම ආණ්ඩුවේ බලය ක්‍රියාවට නැංවීමේ විධික්‍රමයක් වේ.

මෙම ආකාරයට ආණ්ඩුව විසින් **ආණ්ඩුවේ කාර්යයන් හි සුජාතභාවය - යහපත්බව - ශුද්ධත්වය - ජනතාවට ඒත්තු ගැන්වීම හරහාත්** කැරට් **හා කෝටු න්‍යාය භාවිතය හරහාත් සෘජු වාරණය හරහාත් සම්මුතිය , බියගැන්වීම , බලපෑම් කිරීම** වැනි ක්‍රම හරහාත් ආණ්ඩුවේ බලය ක්‍රියාවට නගයි.

# ආණ්ඩුවේ බලය යෙදීමේ උපකරණ

# ආණ්ඩුවේ බලය යෙදීමේ උපකරණ

හැඳින්වීම.

ආණ්ඩුවේ බලය යනු රාජ්‍යය සතු ස්වාධිපත්‍යය බලය ක්‍රියාත්මක කිරීමේ නෛතික හිමිකම වේ. මෙම බලය ක්‍රියාත්මක කිරීමේ උපකරණ ආණ්ඩුවේ බලය යෙදීමේ උපකරණ ලෙස ද ආණ්ඩුවේ බලය ක්‍රියාවට නැංවීමේ උපකරණ ලෙස ද හඳුන්වයි.

- <u>**ආණ්ඩුව තම බලය ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරන ප්‍රධාන උපකරණ දෙකකි.**</u>

  i **පොලීසිය**  
  ii **සිවිල් සේවය (රාජ්‍යය සේවය)**

**පොලීසිය**

- <u>පොලීසිය හැඳින්වීම.</u>

ආණ්ඩුවේ බලය යෙදීම සඳහා ඇති එක් උපකරණයක් වන්නේ පොලීසිය යි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් **ආණ්ඩුව තම බලය යොදන එක් ක්‍රමයක් වන්නේ තුවක්කුවයි.** ඒ සඳහා භාවිතයට ගනු ලබන හස්තය වන්නේ පොලීසිය යි.

- <u>පොලීසිය ස්ථාපනය කර ඇති ආකාරය</u>

ශ්‍රී ලංකාව තුළ **1865 අංක 16 දරණ ආඥා පනත** මගින් පොලීසිය ස්ථාපනය කර තිබේ. <u>පොලීසිය ප්‍රධාන කොටස් දෙකකට බණ්ඩනය කළ හැකිය.</u>

| | | | |
|---|---|---|---|
| i | **රහස් පොලීසිය** | - | රහස් පොලීසිය යනු සැඟවී සිට තොරතුරු, අපරාධ , ගවේෂණය කරන පොලීසිය යි. |
| ii | **අපරාධ මර්දන පොලීසිය** | - | අපරාධ වෙනුවෙන් ක්‍රියාත්මක වන සාමාන්‍යය පොලීසිය අපරාධ මර්දන පොලීසිය ලෙස නිර්වචනය කළ හැකිය. |

<u>පොලීසිය සංවිධාන ගතවී ඇති ධූරාවලිය </u>සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම. **පොලිස්පති - නියෝජ්‍ය පොලිස්පති - පළාත් භාර නියෝජ්‍ය පොලිස්පති - ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී - සහකාර පොලිස් අධිකාරී - පොලිස් පරීක්ෂක - උප පොලිස් පරීක්ෂක - සාජන්ට් - කොස්තාපල්.** මෙම පොලිස් සේවය සඳහා ස්ත්‍රීන් ද බඳවා ගනී.

- <u>පොලීසියේ කාර්යය භාරය</u>

හදිසි ගැටුම් වලදී මැදිහත්වීම - මංමාවත් වල රථවාහන පාලනය - රාත්‍රී මුරසේවය පවත්වාගෙන යාම - සොරකම් දූෂණ සම්බබ්ධයෙන් ක්‍රියාත්මක වීම - උත්සව ආවරණය කිරීම වැනි කාර්යයන් පොලීසිය විසින් සිදු කරයි.

- <u>පොලීසියේ ස්වාධීනත්වය</u>

**පොලීසිය ස්වාධීනව පැවතිය යුතුය.** විශේෂයෙන් රාජ්‍යය හා මහජනතාව යන පාර්ශවයන් දෙක සම්බන්බන්ධයෙන් ම පොලීසිය ස්වාධීන විය යුතුය. **නමුත් ප්‍රායෝගික භාවිතය තුළ සිදුවන්නේ** <u>ආණ්ඩුව විසින් පොලීසිය තමන්වෙත අවනත කරවාගැනීමයි. පසුව පොලීසිය හරහා මහජනතාව ආණ්ඩුව වෙත අවනත කරවාගැනීමට උත්සාහ ගනී.</u>

## සිවිල් සේවය

- <u>සිවිල් සේවය හැඳින්වීම.</u>

ආණ්ඩුවේ තම බලය යෙදීම සඳහා භාවිතා කරන තවත් උපකරණයක් වන්නේ සිවිල් සේවය හෙවත් රාජ්‍යය සේවයයි. **ආණ්ඩුව තම බලය යෙදීම සඳහා පැන භාවිතා කරයි.** ඒ සඳහා භාවිතා කරන හස්ථය සිවිල් සේවයයි. ආණ්ඩුවේ වැඩකටයුතු ජනතාව අතර ක්‍රියාත්මක කරනු ලබන්නේ රාජ්‍යය සේවය නිසා එය විධායක් ලෙස හඳුන්වයි. ආණ්ඩුව නිතර වෙනස් වුව ද රාජ්‍ය සේවය වෙනස් නොවී ස්ථාවරව පවතින නිසා එය රටක **ස්ථිර විධායකයක ලෙස හඳුන්වයි.**

- <u>සිවිල් සේවය ස්ථාපනය කර ඇති ආකාරය</u>

ග්‍රාම නිලධාරියාගේ පටන් අමාත්‍යංශයේ ඉහළම නිලධාරියා දක්වා සංවිධානය කරන ලද **නිලබල ක්‍රමය** යටතේ රාජ්‍යය සේවය සංවිධාන ගත කරයි. රාජ්‍යය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන අංශය වන්නේ රාජ්‍යය පරිපාලනය යි. රාජ්‍යය පරිපාලන කටයුතු සිදුවන්නේ රාජ්‍යය සේවකයින් හරහාය.

- <u>රාජ්‍ය සේවයේ කාර්යය භාරය</u>

රාජ්‍ය සේවයේ කාර්යය භාරය වන්නේ ආණ්ඩුවේ තීරණ හා ප්‍රතිපත්ති ජනතාව අතර ක්‍රියාත්මක කිරීමයි. ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන සියලු වැඩසටහන් ජනතාව අතරට ගෙනයන පිරිස බවට පත්වන්නේ රාජ්‍යය සේවයයි.

- <u>රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය</u>

**රාජ්‍ය සේවය ස්වාධීන විය යුතුය.** විශේෂයෙන් ආණ්ඩුව හා මහජනතාව යන පාර්ශව දෙකටම ස්වාධීනව කටයුතු කළ යුතුය. නමුත් **ප්‍රායෝගික භාවිතය** තුළදී ආණ්ඩුව විසින් රාජ්‍යය සේවය තමන් වෙත අවනත කර ගනී. රාජ්‍ය සේවකයින් හරහා මහජනතාව ආණ්ඩුව වෙත අවනත කරගැනීමට උත්සා ගනී.

මෙම ආකාරයට ආණ්ඩුව තම බලය යොදන ප්‍රධාන උපකරණ වන **පොලීසිය හා සිවිල් සේවය** විග්‍රහ කළ හැකිය. තවදුරටත් **අධිකරණ** - **බන්ධනාගාර** - **සිරමැදිරි** - **හමුදාව** - **එල්ලුම්ගහ** - **පෝරක** ආදී **නෛතික උපකරණ** ආණ්ඩුවේ බලය යෙදීමට පවතී.

# ආණ්ඩුවේ බලය සංවරණය කිරීමේ මාර්ග

# ආ ණ්ඩුවේ බලය සංවරණය කිරීමේ මාර්ග

හැඳින්වීම

ආණ්ඩුවේ බලය සංවරණය කිරීම යනු කුමක්දැයි සරලව නිර්වචනය කරන්නේ නම් ඉන් අර්ථවත් වන්නේ ආණ්ඩුවේ බලය කිසියම් සීමාවකට , පාලනයකට ලක් කිරීමයි. ආණ්ඩුවේ බලය සංවරණය නොකළහොත් හෝ එම බලය තනි පුද්ගලයෙකු අත ඒකරාශී වුවහොත් නියත ලෙසම නිර්මාණය වන්නේ ඒක තන්ත්‍ර හිතුවක්කාරී පාලන ක්‍රමයක් ය. එම නිසා ආණ්ඩුවේ බලය සංවරණය කළ යුතු යැයි දේශපාලන විද්‍යාඥයින්ගේ මතය යි.

දාර්ශනික මත

- ආණ්ඩුවේ බලය සංවරණය කළයුතු බවට ඉදිරිපත්වී ඇති දාර්ශනික මත

> " නිදහස ආරක්ෂා කිරීම සඳහාත් ආණ්ඩුව හිතුවක්කාරී වීම වැළැක්වීම සඳහාත් ආණ්ඩුවේ බලය අනිවාර්යයෙන්ම සංවරණය කළ යුතුය."
>
> -ඇක්ටන් සාමි-

හේතු

- ආණ්ඩුවේ බලය සංවරණය කිරීමට අදාළ හේතු

i හිතුවක්කාරී - අත්තනෝමතික - ආඥාදායක පාලන ක්‍රමයන් නිර්මාණය වීමට ඇති අවකාශය සීමා කිරීමට.

ii මහජනතාවගේ නිදහස හා ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට.

iii ව්‍යවස්ථාදායක , විධායක හා අධිකරණ යන ත්‍රිවිධ ආයතන අතර බල තුලනයක් ඇති කිරීමට.

iv ආඥාදායක පාලන ක්‍රමයන් ගෙන් රාජ්‍යය මුදවා ගැනීමට.

v අධිකරණයේ ස්වාධීනත්ව ආරක්ෂා කිරීමට.

■ ආණ්ඩුවේ බලය සංවරණය කිරීමට යොදා ගතහැකි උපක්‍රම (විධික්‍රම / මාර්ග)

ආණ්ඩුවේ බලය සංවරණය කිරීම සඳහා යොදා ගන්නා මාර්ග - උපක්‍රම - උපකරණ - විධික්‍රම - න්‍යායන් කිහිපයකි. මේවා අධ්‍යයනයේ පහසුව සඳහා ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැක.

| | | |
|---|---|---|
| i | නෛතික උපක්‍රම (නීතිමය ක්‍රම) | බලය බෙදීම - සංවරණ තුලන සිද්ධාන්තය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - ව්‍යවස්ථානුකූල වාදය නීතියේ ආධිපත්‍යය - අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය |
| ii | අනියම් උපක්‍රම (ප්‍රායෝගික ක්‍රම) | මහජන මතය - බලපෑම් කණ්ඩායම් - සිවිල් සමාජය ජනමාධ්‍යය - විරුද්ධ පක්ෂය |

i <u>බලය බෙදීම.</u>

ආණ්ඩුවේ බලය සංවරණය කිරීම සඳහා ජනතාවගේ නිදහස අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම සඳහා භාවිත කරන ප්‍රධාන මූලධර්මයක් ලෙස බලය බෙදීම පෙන්වා දිය හැකිය.

- <u>බලය බෙදීම සඳහා භාවිත කරන ක්‍රම දෙකකි.</u>

i ප්‍රාදේශීය වශයෙන් බලතල බෙදීම.
ii කාර්යාත්මක වශයෙන් බලතල බෙදීම.

- **ප්‍රාදේශීය වශයෙන් බලතල බෙදීම.**

ආණ්ඩුවේ බලය සංවරණය කිරීම සඳහා ප්‍රාදේශීය වශයෙන් බලතල බෙදීම සිදු කරයි. **මධ්‍යම ආණ්ඩුවට අමතරව පාලන කටයුතු සම්බන්ධයෙන් ප්‍රාදේශීය ඒකක නිර්මාණය කිරීම මගින් ප්‍රාදේශීය වශයෙන් බලතල බෙදා වෙන්කිරීම** සිදු කළ හැකිය. එමගින් මධ්‍යය ආණ්ඩුවේ අත්තනෝමතික භාවය සීමා වේ.

නිදර්ශන

- ඒකීය ආණ්ඩුක්‍රමයක් ක්‍රියාත්මක වන රාජ්‍යයන් තුළ පරිපාලනයේ පහසුව සඳහා ව්‍යවස්ථාදායකය තුළ ඇතිකරගත් පනත් මගින් ප්‍රාදේශීය පාලන ඒකක නිර්මාණය කරයි.

ලංකාව තුළ - නගර සභා , මහනගර සභා , ප්‍රාදේශීය සභා
බ්‍රිතාන්‍යය තුළ - පේරුසභා , කෝරල සභා , කොරනල් සභා , වසම්

- සංධීය ආණ්ඩුක්‍රමයන් ක්‍රියාත්මක වන රාජ්‍යයන් තුළ මධ්‍යයම ආණ්ඩුව ට අමතරව ප්‍රාන්ත ආණ්ඩු වලට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලතල බෙදීම.

ඇමරිකාව - ප්‍රාන්ත ඒකක 50 ක්
ඉන්දියාව - ප්‍රාන්ත ඒකක 27 ක්

ප්‍රාදේශීය ඒකක මගින් අධ්‍යාපන - සෞඛ්‍යය - ප්‍රවාහනය - කෘෂිකර්මාන්තය - ධීවර ආදී බලතල ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාවට නැංවිය හැකිය. ඒ මතින් මධ්‍යය ආණ්ඩුවේ බලය සංවරණය වේ.

- **කාර්යාත්මක වශයෙන් බලතල බෙදීම.**

ආණ්ඩුවේ බලය සංවරණය කිරීම සඳහා කාර්යාත්මක වශයෙන් බලතල බෙදීම භාවිතා කරයි. **කාර්යාත්මක වශයෙන් බලතල බෙදීම යන්නෙන් අර්ථවතක් වන්නේ ආණ්ඩුවේ කාර්යයන් ව්‍යවස්ථාදායක , විධායක , අධිකරණ ආදීව බෙදා දැක්වීමයි.** කාර්යාත්මක වශයෙන් බතලත බෙදීම සඳහා භාවිතා කරනු ලබන්නේ **බලතල බෙදීමේ න්‍යාය** යි. එමගින් ව්‍යවස්ථාදායකය මගින් නීති සම්පාදන කාර්යයත් විධායක මගින් නීති ක්‍රියාත්මක කිරීමත් , අධිකරණය මගින් නීති විනිශ්චය කිරීමත් සිදු කළ යුතු බව විග්‍රහ කරයි.

මෙම කාර්යයන් එකිනෙකට වෙනස් පුද්ගල හා පුද්ගල කණ්ඩායම් මගින් ක්‍රියාත්මක කළ යුතු බව ද ඉන් ප්‍රකාශිතය. එම නිසා එමගින් **කාර්යාත්මක වශයෙන් මෙන්ම පුද්ගලානුබද්ධ වශයෙන් ද** බලතල විබේධනය සම්බන්ධයෙන් මත පළ කරයි.

මෙම බලය බෙදීම මගින් ආණ්ඩුවේ බලය සංවරණයට ලක්වෙයි. එම නිසා පුද්ගල නිදහස අයිතිවාසිකම් ආරක්ෂාවෙයි. එම නිසා අත්තනෝමතික ආඥාදායක ඒකාධිපති පාලන ක්‍රමයන් උත්පාදවීම වැළකෙයි. සරලව දක්වන්නේ නම් ආණ්ඩුවේ බලය සංවරණය සඳහා බලතල බෙදීම භාවිතා කරයි.

## ii <u>සංවරණ තුලන සිද්ධාන්තය</u>

(**N.B** - මෙම Tute එකේ ඉදිරි පාඩම වැඩිදුර අධ්‍යයනය කරන්න.)

සංවරණ තුලන සිද්ධාන්තය යනු කුමක්දැයි නිර්වචනය කරන්නේ නම් එය මෙසේය. <u>එක් ආයතනයක් තමන්ට පවරාදී ඇති බලය ඉක්මවා ක්‍රියාත්මක වන විට අනෙක් ආයතනය ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වී එම ආයතනය පාලනය කිරීමේ ක්‍රියාවලිය යි.</u>

තවදුරටත් ,

**"ත්‍රිවිධායතන එකිනෙකින් පාලනය වීම හරහා එක් ආයතනයක ආධිපත්‍යයක් මතුවීම වැළැක්වීම සංවරණ තුලන සිද්ධානත්ය වේ."**

මෙම සංවරන තුළන සිද්ධාන්තය භාවිත කිරීම නිසා <u>ආණ්ඩුවේ අධික බලය සංවරණයට එනම් පාලනයට , සීමාවට , ඇවිරීමට ලක්වේ.</u> **සංවරණ තුලන සිද්ධාන්තයට අදාළ පූර්වාදර්ශය වන්නේ ඇමරිකානු ආණ්ඩුක්‍රමයයි.**

## iii <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව</u>

(**N.B** - මීට අදාළ තොරතුරු මෙම Tute එකේ ඉදිරි පාඩම තුළ වැඩිදුරට දක්වා ඇත.)

ආණ්ඩුවේ බලය සංවරණය කිරීම සඳහා භාවිත කරන උපක්‍රමයක් , විධික්‍රමයක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දැක්විය හැකිය.

**"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු රටක් පාලනය කරන මූලික නීතිය යි."** වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් , **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු රටේ ක්‍රියාත්මක වන මූලික ආයතන පිළිබඳ විස්තර කරන වැඩ පිළිවෙලක් වේ. එනම් ව්‍යවස්ථාදායක , විධායක , අධිකරණ ත්‍රිවිධ ආයතන සතු බලතල , කාර්යයන් , සංයුතිය , එම ආයතන අතර ඇති සම්බන්ධතාවය , එම ආයතන හා මහජනතාව අතර ඇති සම්බන්ධතාවය විස්තර කරන වැඩපිළිවෙලක් වේ."**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම නිසා ආණ්ඩුවේ අත්තනෝමතික භාවය සීමාවට ලක්වෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක කාර්යයභාරය අධ්‍යයනය තුළින් මෙය තවදුරටත් තහවුරු වේ.

### iv <u>ව්‍යවස්ථානුකූලවාදය</u>

(**N.B** - මෙම Tute එකේ ඉදිරි පාඩම වැඩිදුර අධ්‍යයනය කරන්න.)

ආණ්ඩුවේ බලය සංවරණය කිරීම සඳහා භාවිත කරනු ලබන තවත් මූලධර්මයක් වන්නේ ව්‍යවස්ථානුකූල වාදයයි.

ව්‍යවස්ථානුකූල වාදය යන්නෙහි සරල අර්ථය වන්නේ **"පාලන කටයුතු සිදුකළ යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අනුකූලවය යන්නවේ."** තවදුරටත් මෙය විග්‍රහ කරනු ලබන්නේ නම් **"ආණ්ඩුකරණය සිදු කළ යුත්තේ නීති හා රෙගුලාසි වලින් ඇතිකරන ලද සීමාවන්ට යටත්ව ය"** යන්න ඉන් සංකේතවත් වේ.

මෙසේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අනුව , නීති හා රෙගුලාසි වලින් ඇතිකරණ ලද සීමාවන්ට යටත්ව පාලන කටයුතු සිදුකරන විට ආණ්ඩුවේ බලය සංවරණය වේ.

### v <u>නීතියේ ආධිපත්‍යය</u>

(**N.B** - ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය Tute එක අධ්‍යයනය කරන්න.)

නීතියේ ආධිපත්‍යය යන මූලධර්මය ද ආණ්ඩුවේ බලය සංවරණය කිරීම සඳහා භාවිත කරන ප්‍රධාන විධික්‍රමයකි.

නීතියේ ආධිපත්‍යය යනු කුමක්දැයි නිර්වචනය කරන්නේ නම් **"නීතියට අනුව පාලනය කිරීමයි"** නොඑසේ නම් **"නීතියේ බලය"** ඉන් සංකේතවත් වේ. තවදුරටත් **"පාලකයා මෙන්ම පාලිතයා ද නීතිය ඉදිරියේ එක සමානවීම- නීතියට යටත්වීම"** ඉන් අර්ථවත් වේ.

මෙම නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක වන විට ආණ්ඩුවේ බලය සංවරණයට ලක්වේ. එම නිසා අත්තනෝමතික ආඥාදායක පාලන ක්‍රමයන් ඇතිවීමේ අවකාශය සීමා වේ.

### vi <u>අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය</u>

(**N.B** - වැඩිදුර අධ්‍යයනය සඳහා නිර්දේශිත ආණ්ඩුක්‍රමයන්හි අධිකරණ පාඩම් අධ්‍යයනය කරන්න.)

ආණ්ඩුවේ බලය සංවරණය කිරීම සඳහා භාවිත කරන තවත් මූලධර්මයක් වන්නේ <u>අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය</u> යි. මෙය <u>අධිකරණ විවරණ බලය</u> ලෙස ද නාමකරණය කරයි.

අධිකරණ ප්‍රතිනිරීක්ෂණය යනු , **ව්‍යවස්ථාදායකය සම්පාදනය කරන නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ද නැද්ද යන්න පරීක්ෂා කිරීමට** අධිකරණයට ඇති බලය වේ. යම් නීතියක් ව්‍යවස්ථාවට අනුකූල නොවන්නේ නම් එනම්, ව්‍යවස්ථාව **උල්ලංඝණය කරන්නේ නම්** එම නීතිය **නිශේධනය කිරීමට** අධිකරණය සතු ශක්‍යතාවය අධිකරණ විවරණ බලය යන්නෙන් සංකේතවත් වේ.

<u>අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය සහිත අධිකරණයන්ට නිදර්ශන</u> ලෙස ඇමරිකානු ශ්‍රේෂ්ඨාධිකරණය - **ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය** පෙන්වා දිය හැක.

- <u>අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය තුළ ඇති වාසි හා අවාසි</u>

වාසි ____________

- ව්‍යවස්ථාදායක හා විධායකය ස්වකීය කටයුතු නිවැරදිව ඉටුකරන්නේදැයි පරීක්ෂාකිරීමට අධිකරණයට හැකිවීම.
- ජනතාවගේ නිදහස , ආරක්ෂාව , අයිතිවාසිකම් තහවුරුවීම.
- අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂාවීම.
- නීතියේ ආධිපත්‍යය තහවුරුවීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ගරුත්වය ආරක්ෂාවීම.
- ව්‍යවස්ථානුකූල වාදය ක්‍රියාත්මක වීම.

අවාසි ____________

- ජනතා නියෝජිතයින්ට බලපෑම් කිරීමට ජනතා නියෝජිතයින් නොවන අධිකරණයට හැකිවීම.
- ආණ්ඩුවේ කාර්යක්ෂමතාවය හා සහයෝගය බිඳවැටීමට ඇති අවකාශය වැඩිවීම.
- ජනතාවගේ යහපත වෙනුවෙන්යැයි ප්‍රකාශ කරමින් අධිකරණයට ව්‍යවස්ථාදායකයේ හා විධායකයේ කාර්යයන්ට බාධා කිරීමට හැකිවීම.

මෙම අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය නිසා ව්‍යවස්ථාදායකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අතික්‍රමණය කරමින් ව්‍යවස්ථාදාන කෘත්‍යය සිදු කිරීමට අවකාශය නොමැත. එම නිසා ඒ මතින් ආණ්ඩුවේ බලය සංවරණය වේ.

vii <u>මහජනමතය</u>

(**N.B** - වැඩිදුර අධ්‍යයනය සඳහා දේශපාලන ක්‍රියාදාමය Tute එක අධ්‍යයනය කරන්න.)

ආණ්ඩුවේ බලය සංවරණයවීම සඳහා බලපාන අනියම් මූලධර්මයක් ලෙස මහජන මතය පෙන්වා දිය හැකිය.

මහජන මතයට "ජනතා හඬ" "ආශාවන් ප්‍රකාශකිරීම" ලෙස ද ව්‍යවහාරික අර්ථ පවතී. මහජන මතය යනු **"ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් - දේශපාලන වශයෙන් වැදගත් පුද්ගලයෙකු සම්බන්ධයෙන් - දේශපාලන වශයෙන් වැදගත් සිදුවීමක් සම්බන්ධයෙන් යම් දෙන ලද අවස්ථාවකදී ජනතාව විසින් ප්‍රකාශ කරන අදහස් වල සාමාන්‍යය කරණය කරන ලද අදහසයි."**

viii **<u>බලපෑම් කණ්ඩායම්</u>**

(**N.B** - වැඩිදුර අධ්‍යයනය සඳහා දේශපාලන ක්‍රියාදාමය Tute එක අධ්‍යයනය කරන්න.)

ආණ්ඩුවේ බලය සංවරණය වීම කෙරෙහි බලපාන නෛතික නොවූ අනියම් මූලධර්මයක් ලෙස බලපෑම් කණ්ඩායම් හඳුනාගත හැකිය.

බලපෑම් කණ්ඩායම් (ආශා කණ්ඩායම්) යනු **"දේශපාලන බලය හැසිරවීම සඳහා සහභාගී නොවන නමුත් ආණ්ඩුවේ තීරණ වලට බලපෑම් කිරීමේ අරමුණින් එකට එකතුවූ පුද්ගල කණ්ඩායම"** ලෙස සරලව නිර්වචනය කළ හැකිය.

<u>බලපෑම් කණ්ඩායම් වලට නිදර්ශන</u> ලෙස **වෘත්තීය සමිති - ආගමික සංවිධාන - විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්** ආදිය දැක්විය හැකිය.

මෙම බලපෑම් කණ්ඩායම් වල ක්‍රියාකාරීත්වය නිසා ද ආණ්ඩුවේ බලය කිසියම් ප්‍රමාණයකට සංවරණය වේ.

ix **<u>සිවිල් සමාජය</u>**

(**N.B** - වැඩිදුර අධ්‍යයනය සඳහා දේශපාලන ක්‍රියාදාමය Tute එක අධ්‍යයනය කරන්න.)

සිවිල් සමාජය යන මූලධර්මය මගින් ද ආණ්ඩුවේ අධික බලය සංවරණය වන ආකාරය හඳුනාගත හැකිය. විශේෂයෙන් සිවිල් සමාජයේ ක්‍රියාකාරීතවය මගින් මෙම තත්ත්වය ඇති වේ. සිවිල් සමාජය යන මූලධර්මය ද ආණ්ඩුවේ බලය සංවරණය කිරීම සඳහා භාවිතා කරන මූලධර්මයකි.

x **<u>ජනමාධ්‍යය</u>**

ආණ්ඩුවේ බලය සංවරණයවීම සඳහා <u>ස්වාධීන ජනමාධ්‍යයක</u> ක්‍රියාකාරීත්වය බලපායි. **ආණ්ඩුවේ වැඩ කටයුතු ජනතාවට හෙළිකිරීම - ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය නිසා ජනතාවට ඇතිවිය හැකි තත්ත්වයන් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම - ජනතාව නිරන්තර අවධානයකින් හා දැනුවත් භාවයකින් යුතු පිරිසක් බවට පත්කිරීම** වැනි ක්‍රියාමාර්ග මගින් ජනමාධ්‍යය ආණ්ඩුවේ බලය සංවරණය කරන මූලධර්මයක් බවට පත්වේ.

xi **<u>විරුද්ධ පක්ෂය</u>**

විරුද්ධ පක්ෂය ද ආණ්ඩුවේ බලය සංවරණය කිරීම සඳහා හේතු වන මූලධර්මයකි. ශක්තිමත් විරුද්ධ පක්ෂයක් පවතින්නේ නම් ආණ්ඩුවේ අත්තනෝමතික හැසිරීම පාලනය වේ. **ආණ්ඩුවේ වැඩකටයුතු විවේචනය - ආණ්ඩුවේ දුර්වලතාවයන් දූෂණ අක්‍රමිකතා ජනතාවට පෙන්වාදීම - ආණ්ඩුවේ වැඩකටයුතු සම්බන්ධයෙන් විමසිල්ලෙන් පසුවීම - ආණ්ඩුවේ වැඩකටයුතු සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම - ආණ්ඩු බලය අත්පත් කර ගැනීම සඳහා අනවරත අරගලයක යෙදීම** ශක්තිමත් විරුද්ධ පක්ෂයක් විසින් සිදුකරනු ලබන ක්‍රියාවන්වේ. මෙවැනි තත්ත්වයක් මත ආණ්ඩුවේ බලය සංවරණය වේ.

# බලතල බෙදීමේ න්‍යාය

# බලතල බෙදීමේ න්‍යාය

හැඳින්වීම

වාවස්ථාදායක , විධායක සහ අධිකරණ වශයෙන් ආණ්ඩුවේ බලය බෙදිය යුතුයැයි දක්වන මතය බලතල බෙදීමේ න්‍යාය ලෙස නිර්වචනය කළ හැකිය. මෙය **කාර්යාත්මක** වශයෙන් බලතල පංගුකිරීමක් ලෙස ද අර්ථකතනය කළ හැකිය.

**නීති සම්පාදන කටයුතු වාවස්ථාදායකයටත්**
**නීති ක්‍රියාත්මක කිරීමේ කටයුතු විධායකයටත්**
**නීති විනිශ්චය කිරීමේ කටයුතු අධිකරණයටත්,** බෙදා දැක්විය යුතු යැයි මින් අර්ථවත් වේ.

වාවස්ථාදායක , විධායක , අධිකරණ යන ත්‍රිවිධ ආයතන **කාර්යාත්මක වශයෙන් හා පුද්ගලානුබද්ධ වශයෙන්** ඒකාබද්ධ නොවිය යුතුයැයි බලතල බෙදීමේ න්‍යායෙන් අවධාරණය කරයි.

ලක්ෂණ

බලතල බෙදීමේ න්‍යාය තවදුරටත් හඳුනාගැනීම සඳහා එම න්‍යාය සතු ලක්ෂණ අධ්‍යනය කිරීම වැදගත් වේ.

- ආණ්ඩුවේ **කාර්යයන් ඉතා** පැහැදිලිව වාවස්ථාදායක , **විධායක** සහ අධිකරණ වශයෙන් බෙදා දැක්වීම.
- එක් ආයතනයක කාර්යයන් (භූමිකාව ) වෙනත් ආයතනයක් විසින් සිදු නොකිරීම.
- එකිනෙකට වෙනස් පුද්ගල හෝ පුද්ගල කණ්ඩායම් විසින් බලතල ක්‍රියාවට නැගීම.
- ආයතන තුනටම සමාන අයුරින් බලය හිමිකරදීම.
- ත්‍රිවිධ ආයතන අතර සංවරණ තුලන සිද්ධාන්තය ක්‍රියාත්මකවීම.

බිහිවීමට හේතු

බලතල බෙදීමේ න්‍යාය සම්බන්ධ සංවාදය තුළදී මෙම න්‍යාය උත්පාදයට අදාළ හේතු පිළිබඳ අවධානය යොමු කළ යුතුය. **ඒවා නම්,**

i යුරෝපීය සමාජය රැඩිකල් වෙනසකට භාජනය වීම.

ii එංගලන්ත ආණ්ඩුක්‍රමය තුළ සිදු වූ වර්ධිත තත්ත්වයන්

iii නිදහස්කාමී අදහස් වර්ධනය වීම.

iv ධනවාදී අර්ථක්‍රමය සහ ධනපති පන්තියේ වර්ධනය.

i **<u>යුරෝපීය සමාජය රැඩිකල් වෙනසකට භාජනය වීම.</u>**

යුරෝපා කළාපය තුළ ජාතික රාජ්‍යයන් මුල් අදියර තුළම උත්පාද විය. එම ජාතික රාජ්‍යයන් තුළ පරම අසහාය බලැති පාලන ක්‍රම නිර්මාණය විය. එම අසහාය බලැති පාලකයන්ට ව්‍යවස්ථාදායක , විධායක හා අධිකරණ සියලු බලතල සංකේන්ද්‍රගතව තිබිණි. එම නිසා ,

"පාලකයා උත්තරීතර නීති සම්පාදකයා ද . . . . උත්තරීතර නීති ක්‍රියාත්මක කරන්නා ද . . . . . උත්තරීතර නීති විනිශ්චය කරන්නා ද විය."

මෙසේ ජාතික රාජ්‍යයන් තුළ අසහාය බලැති පාලන ක්‍රම නිර්මාණය වූ අතර අනෙක් පසින් <u>**කෘෂි අර්ථ ක්‍රමය** දියවී ගොස් **වානිජවාදී අර්ථ ක්‍රමයක්** යුරෝපය තුළ නිර්මාණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස **නව සමාජ අභිලාශයන් රැගත් නව සමාජ කණ්ඩායම් නිර්මාණය** විය. මෙම නව සමාජ කණ්ඩායම් වලට ස්වකීය දේශපාලන - සමාජ - ආර්ථික - සංස්කෘතික නිදහසට අසහාය බලැති පාලන ක්‍රමයන් අවරෝධකයක් බව වැටහුණි. ඒ නිසා නව සමාජ කණ්ඩායම් නිදහස් සංස්කෘතියක් සෙවීමේ ප්‍රතිඵලයක් ලෙස බලතල බෙදීමේ න්‍යාය උත්පාදයට අදාළ වාස්තවික තත්ත්වයන් නිර්මාණය විය.</u>

ii **<u>එංගලන්ත ආණ්ඩුක්‍රමය තුළ සිදු වූ වර්ධිත තත්ත්වයන්</u>**

1688 දී එංගලන්තය තුළ සිදුවූ **උත්කෘෂ්ඨ විප්ලපය** සමඟ අසහාය බලැති රාජාණ්ඩු ක්‍රමය අහෝසි කර පාර්ලිමේන්තුව බලවත් කිරීමට අදාළ තත්ත්වයන් එංගලන්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් විය. ඒ මතින් අසහාය බලැති පාලන ක්‍රමය දියවී යාම සහ ත්‍රිවිධ ආයතන අතර බලය බෙදූ පාලන ක්‍රම ස්ථාපනයට අදාළ තත්ත්වයන් උත්පාද විය.

iii **<u>නිදහස් කාමී අදහස් වර්ධනය වීම.</u>**

**නූතනය තුළ ජෝන්ලොක් - රූසෝ - මොන්ටෙස්ක්‍යු ආදී දාර්ශනිකයන් නිදහස** (Liberty)සම්බන්ධයෙන් ඉතා විශාල වශයෙන් සංවාද පවත්වයි. එහි ප්‍රතිඵලයක් ලෙස නූතන යුරෝපා සමාජය තුළ නිදහස්කාමී අදහස් වර්ධනය වේ. එම නිදහස්කාමී අදහස් නිසා අසහාය බලැති පාලන ක්‍රම පිළිබඳ උනන්දුව දියවී ගොස් බලය බෙදන ලද පාලන ක්‍රම සම්බන්ධයෙන් උනන්දුව වර්ධනය විය. ඒ හරහා බලතල බෙදීමේ න්‍යාය බිහිවීමට අදාළ පාරිසරික තත්ත්වයන් නිර්මාණය විය.

iv **<u>ධනවාදී අර්ථක්‍රමයේ සහ ධනපති පන්තියේ නැගීම.</u>**

**වැඩවසම් ක්‍රමය** බිඳවැටී නූතන යුගය ආරම්භවීමත් සමඟ යුරෝපය තුළ **ධනවාදී අර්ථක්‍රමයේ සහ ධනපති පන්තියේ** නැගීම සිදුවිය. එම ධනපති පන්තියට දේශපාලනයට සම්බන්ධවීමේ උනන්දුවක් ඇති විය. ඒ හරහා ව්‍යවස්ථාදායකය බලය මහජන නියෝජිතයන්ට ද විධායක බලය රජුට ද හිමිවිය යුතුයැයි බුද්ධිමතුන් මත පළ කරයි. සංවාදය පෙළගැසිනි. ඒ හරහා ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ ලෙස බලතල බෙදීම සම්බන්ධයෙන් සංවාදය නිර්මාණය විය.

විකාශනය

බලතල බෙදීමේ න්‍යාය සම්බන්ධ සංවාදය තුළදී මීළඟට අවධානය යොමු කරනු ලබන්නේ එහි <u>ඓතිහාසික විකාශනය</u> සම්බන්ධයෙනි.

ඇරිස්ටෝටල්

**ග්‍රීක අවධිය තුළ ග්‍රීක මහා දාර්ශනික** <u>ඇරිස්ටෝටල්</u> විසින් ආණ්ඩුවේ කටයුතු බෙදා දැක්වීමට අදාළ මූලික සංවාදය සාකච්ඡා කරයි. ඊට අදාළව <u>ආණ්ඩුවේ කටයුතු ප්‍රධාන කොටස් තුනකට</u> <u>බෙදා දක්වයි.</u>

**දේශපාලන කරුණු සාකච්ඡා කිරීම.**
**පොදු වැඩ පරිපාලනය කිරීම.**
**යුක්තිය පසිඳලීම.**

<u>**සෘජු ප්‍රජාතන්ත්‍රවාදය** ක්‍රියාත්මක වූ ග්‍රීක නාගරික රාජ්‍යය ක්‍රමය යටතේ ආණ්ඩුවේ කාර්යයන් බෙදීම සම්බන්ධයෙන් මූලික මතවාදය ගොඩනැගී තිබුණ ද ග්‍රීක නාගරික රාජ්‍යය ක්‍රමය බිඳවැටීමත් සමඟ බිහිවන රෝම මධ්‍යතන අවධි තුළ ක්‍රියාත්මක වූ **අසහාය බලැති රාජාණ්ඩු පාලන ක්‍රම** තුළ බල බෙදීම සම්බන්ධ මතවාදය නිශේධනය වෙයි. නැවත 16 වැනි සියවස තුළ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන න්‍යායක් සමඟ එංගලන්තය කේන්ද්‍ර කොට ගනිමින් බලතල බෙදීම සම්බන්ධ මතවාදය නූතන යුගය තුළ නැවත උත්පාද වෙයි.</u>

හැරින්ග්ටන්

**නූතන අවධිය තුළ එංගලන්ත ජාතික** <u>**හැරින්ග්ටන්**</u> නැමති දේශපාලන විද්‍යාඥයා විසින් බලතල බෙදීම සම්බන්ධව ප්‍රථම වරට මත පළ කරයි.

පසුව,

ජොන් ලොක්

**එංගලන්ත ජාතික ජෝන් ලොක්** විසින් නූතන අවධිය තුළ බලතල බෙදීමේ න්‍යායේ මූලික සංවාදය නිර්මාණය කරයි. ඒ 1689 දී **සිවිල් ආණ්ඩුව පිළිබඳ ප්‍රවාදයන් දෙකක්** කෘතිය මගිනි. ජොන් ලොක් ප්‍රකාශ කළේ,

"ව්‍යවස්ථාදායක, විධායක , අධිකරණ යන ත්‍රිවිධ ආයතන වෙන් වෙන් ව ක්‍රියාත්මක විය යුතු අතර ව්‍යවස්ථාදායක බලය මහජන නියෝජිතයන්ට ද විධායක බලය රජුට ද හිමි විය යුතු බවයි."

මොන්ටෙස්කියු

<u>**නූතන අවධිය තුළ බල බෙදීමේ න්‍යාය වඩාත් විද්‍යාත්මක , දාර්ශනික පදනමකින් ඉදිරිපත් කරන්නේ ප්‍රංශ ජාතික චාල්ස් මොන්ටෙස්කියු ය.**</u> 1748 දී **නීතියේ සාරය කෘතිය** මගින් ඔහු බලතල බෙදීමේ න්‍යාය සම්බන්ධයෙන් අදහස් දක්වයි. <u>නීතියේ සාරය කෘතියට අනුභූතිය බවට පත්වූයේ ප්‍රංශයේ පැවති xiv වැනි ලූවී රජුගේ ආඥාදායක ඒකාධිපති අත්තනෝමතික පාලනය සහ බ්‍රිතාන්‍යයේ පැවති බලතල බෙදන ලද කැබිනට් පාර්ලිමේන්තු පාලන ක්‍රමය යි.</u>

හේතු

<u>චාල්ස් මොන්ටෙස්කියු බලතල බෙදීමේ න්‍යාය ඉදිරිපත් කිරීමට අදාළව පෙන්වා දෙන හේතු කිහිපයකි.</u>

- i **ආණ්ඩුවේ කාර්යක්ෂමතාවය වැඩිකිරීම.**
- ii **අත්තනෝමතික පාලන ක්‍රම නිර්මාණයවීම වැළැක්වීම.**
- iii **ජනතාවගේ නිදහස ආරක්ෂා කිරීම.**

තවදුරටත් මොන්ටෙස්ක්‍යු ප්‍රකාශ කළේ ,

> "යම් අවස්ථාවක අධිකරණ බලය ව්‍යවස්ථාදායක බලය සමඟ එකතුවී ඇත්නම් එහිදී ව්‍යවස්ථාදායකයා විනිශ්චය කරුවෙක් ද වන බැවින් එවැනි තත්ත්වයක් හිතුවක්කාරී පාලනයකට මඟ පාදනු ඇත. අනෙක් අතට අධිකරණ බලය විධායක බලය සමඟ එක්තැන්වී තිබේනම් විධායකය නියත ලෙසම හිංසාකාරී සහ පීඩාකාරී දෙයක් බවට පත් වේ. යම් විටෙක ව්‍යවස්ථාදායක , විධායක හා අධිකරණ බලතල එක් පුද්ගලයෙකු අත හෝ පුද්ගල කණ්ඩායම් අත ඒකරාශීවේ ද එය මිනිස් නිදහසේ නියත අවසානය වනු ඇත."
>
> -චාල්ස් මොන්ටෙස්ක්‍යු-
> නීතියේ සාරය 1748

දුර්වලතා

<u>චාල්ස් මොන්ටෙස්ක්‍යුගේ බලතල බෙදීමේ න්‍යායට එල්ලවී ඇති චෝදනා , විවේචන , (දුර්වලතා) හඳුනාගැනීම.</u>

i ත්‍රිවිධ ආයතන අතර ශුද්ධ බලතල විභේදනයක් සම්බන්ධයෙන් අදහස් පළ කිරීම.

ii ත්‍රිවිධ ආයතන වලට සමානව බලය පැවරිය යුතුයැයි ප්‍රකාශ කිරීම.

iii බලතල බෙදීම පමණක් පුද්ගල නිදහසට ප්‍රමාණවත් යැයි විශ්වාස කිරීම.

iv ත්‍රිවිධ ආයතන අතර ශුද්ධ වශයෙන් බලය බෙදීම හරහා ආණ්ඩුව අකාරක්ෂම වීම.

v බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රමය පූර්වාදර්ශය ලෙස ගෙන බලතල බෙදීමේ න්‍යාය නිර්මාණය කළ ද බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ පවා නිවැරදිව අවබෝධ කොටගෙන නොමැතිවීම.

i <u>ත්‍රිවිධ ආයතන අතර ශුද්ධ බලතල විභේදනයක් සම්බන්ධයෙන් අදහස් පළ කිරීම.</u>

ත්‍රිවිධ ආයතන අතර ශුද්ධ බලතල විභේදනයක් අපේක්ෂා කිරීම මොන්ටෙස්ක්‍යුගේ බලතල බෙදීමේ න්‍යායට එල්ලවී ඇති විවේචනයකි. කිසිඳු නූතන ජාතික රාජ්‍යයක පුද්ගලානුබද්ධ වශයෙන් හෝ කාර්යාත්මක වශයෙන් පරිපූර්ණ බලතල විභේදනයක් හඳුනාගත නොහැකිය. ශුද්ධ වශයෙන් බලතල විභේදනය හරහා ආණ්ඩුවේ ක්‍රියාකාරීතක්වය බිඳ වැටෙයි. මොන්ටෙස්ක්‍යු මෙම තත්ත්වය තේරුම් නොගැනීම දුර්වලතාවයකි.

ii <u>ත්‍රිවිධ ආයතන වලට සමානව බලය පැවරිය යුතුයැයි ප්‍රකාශ කිරීම.</u>

ත්‍රිවිධ ආයතන වලට සමානව බලය බෙදිය යුතු බව මොන්ටෙස්ක්‍යු ප්‍රකාශ කරයි. නමුත් නූතන ජාතික රාජ්‍යයන් තුළ ව්‍යවස්ථාදායකයට හා අධිකරණය අභිබවා විධායකය විශාල වශයෙන් බලවත්වී තිබේ.

iii <u>බලතල බෙදීම පමණක් පුද්ගල නිදහසට ප්‍රමාණවත් යැයි විශ්වාස කිරීම.</u>

බලතල බෙදීම පමණක් පුද්ගල නිදහස ආරක්ෂාවීම සඳහා ප්‍රමාණවත් යැයි විශ්වාස කිරීම දුර්වලතාවයකි. පුද්ගල නිදහස ආරක්ෂාවීම සඳහා නීතිය - නීතියේ ආධිපත්‍ය - මහජන මතය - බලපෑම් කණ්ඩායම් - යහපාලනය - ප්‍රජාතන්ත්‍රවාදය වැනි දේශපාලන සංකල්ප ඉතා වැදගත් වෙයි. මොනුටෙස්ක්‍යු එම සංකල්ප සම්බන්ධයෙන් අවධානය යොමු කොට නැත. එය දුර්වලතාවයකි.

iv <u>ත්‍රිවිධ ආයතන අතර ශුද්ධ වශයෙන් බලය බෙදීම හරහා ආණ්ඩුව අකාරක්ෂම වීම.</u>

ව්‍යවස්ථාදායක , විධායක හා අධිකරණ අතර කාර්යාත්මක වශයෙන් හා පුද්ගලානුබද්ධ වශයෙන් සම්බන්ධතාවයක් නොමැති වූ විට එම ආයතන හුදෙකලා වීම. ඒ හරහා ආණ්ඩුව අකාරක්ෂම වී අකර්මන්‍යය තත්ත්වයට පත්වෙයි. එම නිසා පරිපාලනය බිඳ වැටෙයි. මෙම තත්ත්වය අවබෝධ කර නොගැනීම බල බෙදීමේ න්‍යාය තුළ ඇති දුර්වල තාවයකි.

v <u>බ්‍රිතාන්‍යය ආණ්ඩු ක්‍රමය පූර්වාදර්ශය ලෙස ගෙන බලතල බෙදීමේ න්‍යාය නිර්මාණය කළ ද බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ පවා නිවැරදිව අවබෝධ කොටගෙන නොමැතිවීම.</u>

බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමය තුළ ව්‍යවස්ථාදායක , විධායක හා අධිකරණ ආයතන අතර ඇති සමීප සම්බන්ධය මොන්ටෙස්ක්‍යු පැහැදිලිව අවබෝධකොටගෙන නොමැත. බ්‍රිතාන්‍යය තුළ ත්‍රිවිධි ආයතන අතර පුද්ගලානුබද්ධ වශයෙන් හා කාර්යාත්මක වශයෙන් එකිනෙකට සම්බන්ධ වෙයි.

වැදගත්කම්

<u>චාල්ස් මොන්ටෙස්ක්‍යුගේ බලතල බෙදීමේ න්‍යාය තුළ හඳුනාගත හැකි වැදගත් (යහපත්) ලක්ෂණ</u>

i මිනිස් නිදහස ආරක්ෂාවීම.

ii ආඥාදායක පාලන ක්‍රමයන් බිහිවීම වැළකීයාම.

iii අධිකරණයේ ස්වාධීනත්වයට වැදගත්වීම.

iv ආණ්ඩුවේ කාර්යක්ෂමතාවය වර්ධනයවීම.

විවිධ මතවාද බලතල බෙදීමේ න්‍යාය සම්බන්ධ සංවාදය තුළදී <u>විවිධ න්‍යායන් විසින් ඒ සම්බන්ධයෙන් දක්වා ඇති මතවාදයන් ද අධ්‍යයනය කිරීම වැදගත් වේ.</u>

**ලිබරල්වාදී අදහස්** - පුද්ගල නිදහස ආරක්ෂාවීම සඳහා බලතල බෙදිය යුතු බව දැඩිව පිළිගනී.

**රැඩිකල්වාදී අදහස්** - බලය ජනතාව සතුවේ. ව්‍යවස්ථානුකූල හෝ කිසිඳු සීමාවකින් තොරව එම බලය ක්‍රියාවට නැගීමට ජනතාවට අයිතියක් තිබිය යුතු ය.

**කොමියුනිස්ට් අදහස්** - බලතල බෙදීම කොමියුනිස්ට්වාදීන් ප්‍රතික්ෂේප කරයි. ධනපති පන්තියේ අවශ්‍යතාවයන් හා උවමනාවන් ආරක්ෂා කිරීම සඳහා භාවිතා කරනු ලබන උපක්‍රමයක් ලෙස ඔවුන් එය දකී.

**ෆැසිස්ට්වාදී අදහස්** - ෆැසිස්ට්වාදීන් ද බලතල බෙදීමේ න්‍යාය ප්‍රතික්ෂේප කරයි. ඔවුන් විශ්වාස කරනු ලබන්නේ අසහාය බලැති පාලන ක්‍රමයන් ය.

## ■ <u>බතලත බෙදීමේ න්‍යාය පූර්වාදර්ශය කොටගෙන නිර්මාණය වූ ආණ්ඩුක්‍රම</u>

<u>1789 ඇමරිකානු ආණ්ඩුක්‍රම</u> ව්‍යවස්ථාව නිර්මාණය කිරීමේදීත් <u>1809 ප්‍රංශ පස්වන සමූහාණ්ඩු ආණ්ඩුක්‍රම</u> ව්‍යවස්ථාව නිර්මාණය කිරීමේදීත් බලතල බෙදීමේ න්‍යාය ගුරුකොට ගත් අතර නූතනය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නිර්මාණය කිරීමේදී මෙම න්‍යාය පූර්වාදර්ශය ලෙස භාවිතා කරයි.

- <u>ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ බලතල බෙදීමේ න්‍යාය</u>

ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව චාල්ස් මොන්ටෙස්ක්‍යුගේ බලතල බෙදීමේ න්‍යාය ඒ ආකාරයටම භාවිතයට ගනිමින් නිර්මාණය කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි. වෙනත් ආකාරයකට දක්වන්නේ නම් **ඇමරිකානු ආණ්ඩුක්‍රමයේ බුද්ධිමය ආදර්ශ වූයේ බලතල බෙදීමේ න්‍යායයි.** <u>ඇමරිකානු ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ ප්‍රධාන සාමාජිකයෙකු වූ **ජේම්ස් මැඩිසන්** ප්‍රකාශ කළේ</u> ,

> **"මහජන ඡන්දයෙන් තේරීපත් වුව ද නාමකරණයෙන් තෝරාපත් කළ ද පාරම්පරිකව තේරීපත් වූ එක් පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් අත ව්‍යවස්ථාදායක , විධායක හා අධිකරණ බලය සංකේන්ද්‍රගතවීම නියත ලෙසම කෲර ඒකාධිපතියෙකු තනයි."** යනුවෙනි.

- <u>ඇමරිකානු ආණ්ඩුක්‍රමය නිර්මාණයකිරීමේදී මෙම කෲර ඒකාධිපතියෙකු නිර්මාණයවීම වැළැක්වීම සඳහා භාවිතා කළ උපක්‍රම දෙකකි.</u>

**බලතල බෙදීමේ න්‍යාය.**

**සංවරණය හා තුලනය පිළිබඳ සිද්ධාන්තය.**

## ඇමරිකානු ආණ්ඩුක්‍රමය තුළ බලතල බෙදීමේ න්‍යාය

ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ව්‍යවස්ථාදායක කටයුතු සඳහා - කොංග්‍රස් මණ්ඩලයක් ද විධායක කටයුතු සඳහා - ජනාධිපතිවරයෙක් ද අධිකරණ කටයුතු සඳහා - ශ්‍රේෂ්ඨාධිකරණයක් ද නිර්මාණය කළේ ය.

1880 දී ඇමරිකානු ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ප්‍රකාශයට පත් කළ කිල්බර්න් එරෙහි තොම්සන් නඩු තීන්දුව මගින් ද බලතල බෙදීම ඇමරිකානු ආණුඩුක්‍රම ව්‍යවස්ථාවේ පදනම බව පිළිගෙන තිබේ.

> "ඇමරිකානු ලිඛිත ව්‍යවස්ථානුකූල නීතියේ මූලික ලක්‍ෂණය වන්නේ ජාතික වශයෙන් මෙන්ම ප්‍රාන්ත මට්ටමින් ද ආණ්ඩුවට පැවරී ඇති සෑම බලයක්ම ව්‍යවස්ථාදායක , විධායක සහ අධිකරණ වශයෙන් බෙදා දැක්වීමයි."
>
> -කිල්බර්න් එරෙහි තොම්සන් නඩු තීන්දුව-

## ඇමරිකානු ආණුඩුක්‍රමය තුළ සංවරණ තුලන සිද්ධාන්තය

■ සංවරණ තුලන සිද්ධානත්ය හැඳින්වීම

සංවරණය හා තුලනය කිරීමේ සිද්ධාන්තය යනු කුමක්දැයි සරලව නිර්වචනය කරන්නේ නම් , එක් ආයතනයක් තමන්ට පවරාදී ඇති බලය ඉක්මවා කටයුතු කරන විට අනෙක් ආයතන ස්වයංක්‍රීයවම ක්‍රියාත්මක වී එම ආයතනය පාලනය කිරීමයි.

තවදුරටත් ,

> **"ත්‍රිවිධ ආයතන ස්වයංක්‍රීයවම එකිනෙකින් පාලනයවීම හරහා එක් ආයතනයක ආධිපතිත්වයක් මතුවීම වැළැක්වීම සංවරණ තුලන සිද්ධාන්තය වේ."**

■ සංවරණ හා තුලන සිද්ධානත්යට අදාළ නිදර්ශන

නිදර්ශන

i ව්‍යවස්ථාදායක වන කොංග්‍රස් මණ්ඩලය සකස්කරන පනත් කෙටුම්පත් නීති බවට පත්වීමට විධායක වන ජනාධිපතිවරයාගේ අවසාන අනුමැතිය අවශ්‍යය වීම. ජනාධිපතිට අවශ්‍යය නම් එම පනත්වලට අනුමැතිය නොදී සිටිය හැකිය. එය පනත් නිශේධ කිරීමකි. ජනාධිපතිගේ නිශේධ කරන ලද පනතක් වුව ද කොංග්‍රස් මණ්ඩලයේ 2/3 කින් නීතියක් බවට පත් කළ හැකිය.

ii විධායකය වන ජනාධිපතිවරයාට අයත් බලතල කොංග්‍රස් මණ්ඩලයේ සෙනෙට් සභාවේ අනුමැතියට යටත්ව ක්‍රියාත්මක කළ යුතු වීම, කැබිනට් ලේකම් වරුන් - රාජ්‍යය සේවයේ ඉහළ නිලධාරීන් - සුපිම් උසාවියේ විනිසුරුවන් - රාජ්‍යය උපාය නිලධාරීන් වැනි තනතුරු ජනාධිපතිවරයා තෝරාපත් කළ ද ඒවා සෙනෙට් සභාව තුළින් අනුමත කළ යුතුය. එසේ නොමැති විට එම පත්කිරීම් වලංගු නොවේ.

iii <u>ජනාධිපතිට විදේශ ගිවිසුම් වලට එළඹීමට අවකාශ</u> ඇතත් එම ගිවිසුම් වලංගු වන්නේ සෙනෙට් මණ්ඩලය 2/3 ක විශේෂ බහුතර අනුමත කරන්නේ නම් පමණි.

iv <u>ජනාධිපති ඉවත් කිරීමේ බලය කොංග්‍රසය සතුවීම.</u> රට පාවාදීම - අල්ලස් - අපරාධ වලට හවුල්වීම - චරිත දූෂණය - වැනි චෝදනාමත ජනාධිපතිට එල්ල වන දෝෂාභියෝග චෝදනාව අධිකරණයක් ලෙස රැස්ව විනිශ්චය කරනු ලබන්නේ කොංග්‍රස් මණ්ඩලයයි. එම නිසා දෝෂාභියෝගයකින් ජනාධිපතිවරයා ඉවත් කිරීමට කොංග්‍රස් මණ්ඩලයට හැකිය.

v <u>ව්‍යවස්ථාදායකය වන කොංග්‍රසය සකස් කරන නීති වල ව්‍යවස්ථානුකූල භාවය පරීක්ෂාකිරීමට අධිකරණයට හැකිවීම.</u> කොංග්‍රසය සකස් කරන නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්නේ නම් එම නීති නිශේධ කිරීමට අධිකරණයට බලය ඇත. එය අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය වේ.

vi <u>සුප්‍රීම් අධිකරණය දෙනු ලබන නඩුතීන්දු නව නීති නිර්මාණයට ප්‍රබල ලෙස බලපා තිබේ.</u> නූතන විචාරකයන් පවසන්නේ සුප්‍රීම් අධිකරණය ඇමරිකාවේ තෙවන ව්‍යවස්ථාදායක සභාව බවයි.

vii <u>උසස් අධිකරණ ආයතන වල විනිසුරුවන් ඉවත් කිරීමට කොංග්‍රස් සභාවේ අනුමැතිය මත ජනාධිපතිවරයාට හැකිවීම.</u>

ඉහත ආකාරයට බලතල බෙදීමේ න්‍යාය හා සංවරණ තුලන සිද්ධාන්තය **නෛතික තලය** තුළ දක්වා තිබුණ ද **ප්‍රායෝගික භාවිතය** තුළ විධායකය වන ජනාධිපතිවරයා බලවත් වන ආකාරය ත්‍රිවිධ ආයතන සහයෝගයෙන් ක්‍රියාත්මක වන ආකාරය ඇමරිකානු ආණ්ඩුක්‍රමය තුළින් හඳුනාගත හැකිය.